# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 38 දරන
# සමාජශාලාවලට බලපත්‍ර දීමේ
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 සැප්තැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ඔක්තෝබර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 90 යි    තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 38 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 සැප්තැම්බර් මස 30 වන දින.]

**එල්. ඩී.—ඕ. 17/86.**

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 38 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ), (ආ) සහ (ඇ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) බලපත්‍රය ලබාගත යුතු සමාජ ශාලාව පිහිටා ඇත්තේ යම් උප දිසාපති කොට්ඨාශයක ද එම කොට්ඨාශයේ උප දිසාපතිවරයා මගින් පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා වෙත පිටපත් තුනකින් යැවිය යුතු ය;

(ආ) මේ පනතේ උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුතු ය;

(ඇ) සමාජශාලාවේ රීතිවල සත්‍ය පිටපතක් බවට එහි ලේකම්වරයා, සභාපතිවරයා හෝ කළමනාකරු විසින් යථා පරිදි සහතික කරනු ලැබූ පිටපතක්, 5 වන වගන්තිය යටතේ නිදහස් කරනු ලැබීමට හිමිකම් පාන අවස්ථාවකදී හැර, උචිත බලපත්‍ර ගාස්තුව සහ රුපියල් පණහක ඉල්ලුම් පත්‍ර ගාස්තුව සමඟ එවිය යුතු ය; තව ද";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) (1) මේ උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයේ හෝ එදිනට පසු පිහිටුවනු ලැබූ යම් සමාජශාලාවක් ස්වකීය කටයුතු කරගෙන යාමට අදහස් කරන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානය යම් ආගමික සිද්ධස්ථානයක, පාසලක හෝ ආරෝග්‍යශාලාවක සිට මීටර් දෙසිය පණහක් ඇතුළත පිහිටා තිබේ නම්, ඒ සමාජ ශාලාව සඳහා මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) මේ උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙර හෝ ක්‍රියාත්මක වන දිනයේ දී හෝ එදිනට පසුව පිහිටුවනු ලැබූ සමාජ ශාලාවක් සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබ තිබේ නම් මිස හෝ පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාගත කරනු ලැබ තිබේ නම් මිස, එකී දින සිට සහ එකී දිනයෙන් පසුව, මේ පනත යටතේ ඒ සමාජ ශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම නොකළ යුතු ය:

2 —ඒ 096902—7,260 (87/04)

එසේ වුවද මේ පනත යටතේ සමාජ ශාලාවක් සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මේ උප වගන්තිය ක්‍රියාත්මක වීන් දිනයෙන් පසුව පළමු වින වරට අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට, එම සමාජ ශාලාව එසේ ලියාපදිංචි කර හෝ සංස්ථාගත කර හෝ නොමැති වුවද, එම පළමු වන අලුත් කිරීමේ දින සිට එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුළත, එය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීමේ හෝ පාර්ලිමේන්තු පනතක් මඟින් සංස්ථාගත කිරීමේ හෝ කොන්දේසියට යටත්ව, සළාත් පාලන ආයතනයක් විසින් ඉඩ දිය හැකි ය.

(2ආ) මේ පනත යටතේ බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, සමාජ ශාලාව විසින් ස්වකීය කටයුතු පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන කරුණු සඳහන් කෙරෙන දැන්වීම් පුවරුවක් ඉදිරිපත් කරනු ලබන ස්ථානයෙහි එම කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, එම ඉල්ලීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබ, එය ඉල්ලුම්කරු වෙත දන්වන තෙක්, එම දැන්වීම් පුවරුව ඉවත් කරනු නොලැබිය යුතු අතර, මෙම උපවගන්තියෙහි නියම කරනු ලැබ ඇති පරිදි එවැනි දැන්වීම් පුවරුවක් ඉදි කිරීම සඳහා සැලැස්වීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක, ඔහු මේ පනත යටතේ වරදක් කරන්නේ ය.”; තව ද

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ අතුරු වගන්තිය වෙනුවට, පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

“එසේ වුව ද ඉහත සඳහන් පරිදි නියමිත ගාස්තු පහත සඳහන් සීමා නොඉක්මවිය යුතු ය :—

(අ) යම් මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට රු. 5,000

(ආ) යම් නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට රු. 2,000

(ඇ) යම් සංවර්ධන සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් හෝ සම්බන්ධයෙන් වූ විට ... රු. 500.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“(අඅ) (i) සමාජ හෝ විනෝද කාර්ය සඳහා පිහිටුවා ගන්නා ලද සමාජ ශාලාවක් සම්බන්ධයෙන් වන ඉල්ලීමක පිටපතක් සමාජ සේවා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ii) සංස්කෘතික හෝ ආගමික කාර්ය සඳහා පිහිටුවා ගන්නා ලද සමාජ ශාලාවක් සම්බන්ධයෙන් වන ඉල්ලීමක පිටපතක් සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(iii) යම් ක්‍රීඩා කටයුත්තක් සඳහා පිහිටුවා ගන්නා ලද සමාජ ශාලාවක් සම්බන්ධයෙන් වන ඉල්ලීමක පිටපතක් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

තව ද එම පිටපත ලැබුණු දින සිට සති හතරක් ඇතුළත එකී අධ්‍යක්ෂවරයන් විසින් සමාජශාලාවේ සද්භාවය පිළිබඳ වාර්තාවක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ;".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියෙහි "සුරාබදු කොමසාරිස්වරයා, හෝ" යන වචන වෙනුවට "සුරාබදු කොමසාරිස්වරයා, සමාජසේවා අධ්‍යක්ෂවරයා, සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා, ක්‍රීඩා අධ්‍යක්ෂවරයා හෝ" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "පොලිස් අධිකාරිවරයා හෝ සුරාබදු කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් හැර" යන වචන වෙනුවට "පොලිස් අධිකාරිවරයා, සුරාබදු කොමසාරිස්වරයා, සමාජසේවා අධ්‍යක්ෂවරයා, සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා හෝ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් හැර" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇති "මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද, ඒ ස්ථානය කෙරෙහි පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය." යන වචන වෙනුවට "සමාජ ශාලාව විසින් එහි කටයුතු පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යාමට අදහස් කරනු ලබන ස්ථානය පහත දැක්වෙන කරුණුවලට අනුකූල වන්නේ නම් මිස, මේ උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයේ හෝ එදිනට පසු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ අලුත් කිරීම සඳහා ඉල්ලීමකට අවසර දෙනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඔ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

(ඔ) සමාජශාලාවේ ලියාපදිංචි සාමාජිකයන්ගේ සහ ඔවුන් සමග පැමිණෙන අමුත්තන්ගේ වාහන සඳහා, ප්‍රමාණවත් වාහන නවතා තැබීමේ පහසුකම් සමාජශාලා ස්ථානය ඇතුළත සැලැස්විය යුතු ය;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් සමාජශාලාවක් සම්බන්ධයෙන් ද, එම සමාජ ශාලාවේ ස්ථානය, (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන බවට සභාපතිවරයාට පෙනී යන කවර හෝ යම් අවස්ථාවක, සභාපතිවරයා විසින් ඒ සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු වෙත ලිඛිත දැන්වීමක් යවමින් ඒ දැන්වීමෙහි දැක්වෙන දිනයට පෙර ඒ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස සභාපතිගෙන්, ලේකම්ගෙන් හෝ කළමනාකරුගෙන් ඉල්ලා සිටිය හැකි ය. සභාපතිවරයා විසින්, ස්වකීය අභිමතය පරිදි එකී දැන්වීමෙහි සඳහන් කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය.".

පධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි "මේ පනත යටතේ බලපත්‍රලත් සමාජ ශාලාවක රීතිවල" යන වචන වෙනුවට "මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් සමාජ ශාලාවක් සම්බන්ධයෙන් ද, එම සමාජ ශාලාවේ රීතිවල" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඊ) සමාජ ශාලාවේ ස්ථානය විවෘතව තබන සහ වසා තබන දිනයන් සහ වේලාවන් ;

(උ) ලියාපදිංචි සාමාජිකයන් සමග සමාජ ශාලාවට පැමිණෙන අමුත්තන් අමුත්තන්ගේ ලේඛනයෙහි ලියාපදිංචි කිරීම ; සහ

(ඌ) රීති වෙනස් කිරීමේ ආකාරය;".

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "අවසර පත්‍රය ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ දී (1) වන උපවගන්තියෙහි දැක්වෙන කරුණුවලට අදාළ විධිවිධාන ඇතුළත් රීති සමාජශාලාවකට තිබෙන අවස්ථාවක," යන වචන වෙනුවට "මේ පනත යටතේ සමාජ ශාලාවක් සම්බන්ධ

යෙන් බල පත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ දැක්වෙන කරුණු වලට අදාළ විධිවිධාන ඇතුළත් රීති එම සමාජ ශාලාවට තිබෙන අවස්ථාවක," යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට, පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(3) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් සමාජ ශාලාවක් සම්බන්ධයෙන් ද එම සමාජශාලාවට (1) වන උපවගන්තියේ දැක්වෙන කරුණු අතුරින් සමහරකට පමණක් අදාළ විධිවිධාන ඇතුළත් රීති ඇති අවස්ථාවක, ඉල්ලුම් කරන් ලද විට ඒ සියලුම කරුණු වලට අදාළ විධිවිධාන ඒ රීතිවලට ඇතුළත් වන පරිදි දැනට පවත්නා රීති සංශෝධනය කිරීම සඳහා සභාපතිවරයා විසින්, ස්වකීය අභිමතය පරිදි කාලය ලබා දිය හැකි ය.

(4) සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු විසින් (3) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති කාල සීමාව ඇතුළත (3) වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි රීති සංශෝධනය කළ යුතු අතර, සංශෝධිත රීතිවල පිටපතක් සභාපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය මගින් නියම් කර ඇති පරිදි සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු විසින් රීති සංශෝධනය කර ඒවා සභාපතිවරයා වෙත යැවීමට අපොහොසත් වන අවස්ථාවක, එම සමාජ ශාලාව සම්බන්ධ යෙන් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

"සුරා බදු ආඥාපනත ආදිය අදාළ වීම. 21. සුරා බදු ආඥාපනතේ හෝ අදාළ වන්නා වූ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන කඩ කරමින් හෝ ඒ විධිවිධානවලට අනුකූල වන ලෙසට හැර කිසිම මත්පැන් වර්ගයක් යම් සමාජ ශාලාවක ස්ථානය තුළ තබා ගැනීමට, විකිණීමට, සැපයීමට හෝ පරිභෝජනය කිරීමට බලය දීමක් හෝ අවසර දීමක් මේ පනත යටතේ වූ බලපත්‍රය

කින් කිසිම ආකාරයකින් සිදු වෙන බව නොසැලකිය යුතු අතර, මේ පනත යටතේ බලපත්‍ර දෙනු ලැබූ යම් සමාජ ශාලාවක, එම සමාජ ශාලාවේ සාමාජික යකු ලෙස ලියාපදිංචි තැනැත්තකුට හැර, වෙනත් කිසිම තැනැත්තකුට කිසිම මත්පැන් වර්ගයක් සැපයීම නොකළ යුතු ය :

එසේ වුව ද සමාජ ශාලාවේ යම් ලියාපදිංචි සාමාජිකයකු විසින් ඔහු සමග යම් අමුත්තකු සමාජ ශාලාව වෙත ගෙන එනු ලබන අවස්ථාවක, සමාජ ශාලාවේ රීතිවලට අනුකූලව පවත්වා ගෙන යනු ලබන අමුත්තන්ගේ ලේඛනයෙහි ඔහුගේ නම යථා පරිදි ලියා පදිංචි කිරීමෙන් පසු, ඔහුට මත්පැන් සැපයීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 23අ වන වගන්තිය ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"23අ. මේ පනත යටතේ බලපත්‍රයක් දෙනු ලැබූ සමාජ ශාලාවක ස්ථානය තුළ යම් අශෝභන, දාමරික, කලහකාරී හෝ කැරළිකාරී හැසිරීමකට අවසර දෙන ඒ සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු, මේ පනත යටතේ වරදක් කරන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියෙහි "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්, එම වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සංවර්ධන සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.".

උපලේඛනය

මහා නගර/නගර/සංවර්ධන/ප්‍රාදේශීය සභාව*

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

සමාජශාලාවක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලීම

(මහ නගර සභාවක් සම්බන්ධයෙන් වන විට, නගරාධිපතිවරයා වෙත ද නගර සභාවක්, සංවර්ධන සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වනු විට, සභාපතිවරයා වෙත ද මුල් පිටපත සහ තවත් පිටපත් දෙකකින් යුක්තව එකී සමාජශාලාව පිහිටා තිබෙන උපදිසාපති කොට්ඨාසයේ උපදිසාපතිවරයා මඟින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.)

1. ඉල්ලුම්කරුගේ නම :———.

2. ඉල්ලුම්කරුගේ නේවාසික ලිපිනය :————.

3. ඉල්ලුම් කරනු ලබන්නේ සභාපතිගේ, ලේකම්ගේ හෝ කළමනාකරුගේ තත්ත්වයෙන්ද ? :————.

4. සමාජශාලාවේ නම :————.

5. සමාජශාලාව පිහිටි ස්ථානය :————.

6. සමාජශාලාවේ කටයුතු :————.

7. ඒ කටයුතු ඉටුකරනු ලබන ස්ථානය :————.

8. පහත සඳහන් තැනැත්තන්ගේ නම් සහ නේවාසික ලිපින යන් :—

සභාපති :————.

ලේකම් :————.

කළමනාකරු :————.

9. සාමාජිකත්වය :————.

සාමාන්‍ය ද/ආශ්‍රිත ද/ගෞරවනීය ද* යන වග

10. සමාජශාලා ස්ථානය පනතේ 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වන්නේ ද යන වග :————.

11. සමාජශාලාවේ රීතිවල පනතේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් සියලු කරුණුවලට අදාළ විධිවිධාන ඇතුළත් වන්නේ ද යන වග :—(සමාජශාලාවේ රීතිවල සහතික කළ පිටපතක් කරුණාකර අමුණන්න.)

12. 2 (2අ) වන වගන්තියේ නියමයන් සපුරාලනු ලැබ තිබේ ද යනවග :————.

13. සමාජශාලා ස්ථානයේ මත්පැන්හලක් තිබේද යන වග ; නැත හොත් එහි මත්පැන් පානය සඳහා දෙනු ලැබේද යන වග ; එසේ නම් සුරාබදු බලධාරීන්ගෙන් ඒ සඳහා බලපත්‍රයක්/අවසර පත්‍රයක්* ලබාගෙන තිබේද යන වග :————.

14. පනතේ 5 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටින්නේද යන වග. (5 වන වගන්තියේ කවර ඡේදයක් යටතේ ඒ නිදහස් කිරීම ඉල්ලා සිටින්නේද යන්න සඳහන් කරන්න. ඒ බව සනාථ කෙරෙන ලියකියවිලි ද අමුණන්න.)

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව මම මෙසින් සහතික කරමි.

———————,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———————.

ස්ථානය :———————.

මා ඉදිරිපිටදී

———————,

සමාදාන විනිශ්චයකාර.

උපදිසාපතිවරයාගේ වාර්තාව (සමාජශාලාවේ කටයුතු, සපයා ඇති පහසුකම්, සාමාජිකත්වය ආදිය ගැන විධිමත් පරීක්ෂණයක් කිරීමෙන් පසුව වාර්තාවක් පිළියෙල කොට තම නිර්දේශ ද සමග ඉදිරිපත් කරන ලෙස කොට්ඨාසයේ උපදිසාපතිවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබේ.)

* අදාළ නොවන වචන කපා හරින්න.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා **ඒවා ලබාගත හැකිය.**